# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2310/44 – 2022 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා – 2022.12.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2017 ජනවාරි මස 26 වැනි දින අංක 2003/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2017 අංක 28 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස් වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

*මගේ අංකය:* LD/05/2005/UDA/167.
*ප්‍රාදේශීය ලේකම්ගේ අංකය:* DS/GFG/L&L5/2005/ 04-II.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඩල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු.පි.ගා. 3466 හා 2006.02.09 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් මායිම් තුළ වූ කොටස්:

01. **කැබලි අංක 2 – වලව්වත්තෙ හෙවත් කිරිපට්ටිය වත්ත හෙවත් බෙලිගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.253**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 1, මහාමාර්ගය සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ මෙම පිඹුරේ කැබලි අංක 1; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 1; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 1 සහ මහා මාර්ගය.

EOG 12-0172